# කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# තේ පර්යේෂණ මණ්ඩලය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

## පුරප්පාඩු

## ප්‍රසම්පාදන නිලධාරී (තනතුරු 01 යි)

තලවකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පහත දැක්වෙන තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01 ප්‍රසම්පාදන නිලධාරී**

**රැකියා විස්තරය**

ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී/ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් ගුණත්වය, කාලය සහ කල්පවත්නා බව පිළිබඳව විමසිලිමත් වෙමින් භාණ්ඩ හා සේවාවන් ප්‍රසම්පාදනය කිරීමේ වගකීම.

**බාහිර :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උපාධියක් හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් **සමගින්** රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක දේශීය සහ විදේශීය සැපයුම් කාර්යයන් පිළිබඳව විධායක තත්ත්වයේ එක් (01) අවුරුදු පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**සහ**

සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුදු සහතිකපත් පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර**

කළමනාකරණ සහායක (තාක්ෂණික) කාණ්ඩයේ 1 ශ්‍රේණියේ අදාළ සහ සතුටුදායක වසර (05)ක සතුටුදායක සේවා කාලයක්

**වැටුප් පරිමාණය :** JM 1-2 (2016) රු. 43,355/= 10X755-18X1,135/= රු. 71,335/= මාසිකව

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත තරග විභාගයක් හෝ / සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වෙනත් ප්‍රතිලාභ**

i. නවාතැන් පහසුකම් (පූර්ණ පහසුකම් සහිත නිවස්නයක්) තිබේ නම් සපයනු ඇති අතර, එසේ නොමැති වුවහොත් නවාතැන් පහසුකම් වෙනුවට දීමනාවක් ගෙවනු ඇත.

ii ආයතනයේ වෛද්‍ය පහසුකම් ක්‍රමවේදයෙහි දැනට පවතින රීතීන්ට අනුකූලව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවේ.

iii. **අර්ථසාධක අරමුදල :** තෝරාගත් අයදුම්කරු තම වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක වීම අපේක්ෂා කෙරෙන අතර, ආයතනය මගින් 15% ක දායකත්වයක් ලබාදෙනු ඇත. ආයතනය මගින් සේවක භාරකාර අරමුදලට 3% ක දායකත්වයක් ගෙවනු ඇත.

iv. තේ පර්යේෂණ ආයතනයේ මෙම තනතුරට අදාළ වන අනෙකුත් අමතර ප්‍රතිලාභයන්.

මෙම තනතුර ස්ථිරය. උප්පැන්න සහතික පිටපත, අදාළ අධ්‍යාපන සහ අනෙකුත් වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතික, නව නිපැයුම් හැකියාවන් පිළිබඳ වෙනත් සාක්ෂිවල පිටපත්ද සමග අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ඉල්ලුම්කරුගේ පුහුණුව සහ දැනුම තක්සේරු කළ හැකි ඥාතීන් නොවන තීරකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද ඇතුළත් කර තම අයදුම්පත ඉදිරිපත් කරන්න.

රාජ්‍ය සේවයේ/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ආදියෙහි සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.

තේ පර්යේෂණ ආයතනයේ www.tri.lk වෙබ් අඩවියට පිවිස ඉල්ලා තිබෙන තොරතුරු ගූගල් ආකෘතියෙන් උඩුගත කර සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය අදාළ උපකාරක ලේඛනද සමග ඉදිරි කටයුතු සඳහා 2024 මාර්තු 18 වැනි දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ද කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කරන්න.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බස්,**
**තලවකැලේ.**